# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි.
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂි තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි.

තාක්ෂණික පත්‍රිකා අංක 10 - 2025 ජූනි

# ආරක්ෂිත ගෘහ තුළ නිවැරදිව කැන්ටලූප් වගාව කරමු

කැන්ටලූප් *Cucumis melo* L. යන විද්‍යාත්ම නාමයෙන් හඳුන්වයි. පැණි කොමඩු පවුලට අයත් පළතුරක් වන මෙය ආරක්ෂිත ගෘහ තුළ වගාව සඳහා වඩාත් සුදුසුය. සාමාන්‍යයෙන් පැණි කොමඩු වලට වඩා ඉහල මිලකට වෙළෙඳ පොළ තුල අලෙවි වේ. මෙහි පෝෂණීය වටිනාකම ලෙස



- මෙහි ඉහල කැරොටිනොයිඩ ප්‍රමාණයක් අඩංගු වේ. බොහොමයක් කැනටලූප් වර්ග වල අඩංගු බීටා-කැරොටිනොයිඩ ප්‍රමාණය දොඩම් වලට වඩා 30 ගුණයක් පමණ වේ.
- විටමින් C සහ පොටෑසියම් වලින් පොහොසත්ය.
- ඉහල ඇන්ටි-ඔක්සිඩන්ට් ක්‍රියාකාරීත්වයක් ඇත.
- මදයේ 35% ක් ද, පොත්තෙහි 31% ක් ද ඇට වල 14% ක් වන ලෙස ද ෆිනෝලික් ප්‍රමාණයක් අඩංගු වේ.
- ඇමයිනෝ අම්ල ඉහල ප්‍රමාණයක් අඩංගු වේ.



කැන්ටලූප් වගාව ආරක්ෂිත ගෘහයක් තුළ වගා කිරීම වඩා යෝග්‍ය වන්නේ ,

- ඉහල මිලක් ලබා ගත හැකි ගුණාත්මයෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි වීම
- රෝග හා පළිබෝධ ඉතා අවම කර ගැනීමට හැකි වීම
- පොහොර කාර්යක්ෂමතාවය වැඩිකර ගැනීමට හැකි වීම
- වසර පුරා ආදායමක් ලබා ගැනීමට හැකි වීම
- ඉහල උෂ්ණත්වයට ඔරොත්තු දීම




## වගා ගෘහය තුල වගාව ස්ථාපනය

- වගා මාධ්‍ය ලෙස කොහුබත් හෝ අර්ධව දහනය කල දහයියා : මතුපිට පස් 1 : 2 අනුපාතයෙන් යොදා ගත හැක.
- තවාන් තැටියක බීජ තවාන් කරන්න.
- දින 12 - 14 කට පසුව පත්‍ර 2 - 3 සහිත පැල, අගල් 16 විශ්කම්භයෙන් යුතු වගා මලු වලට මාරු කරන්න.
- ඉන් පසුව වැල, සිරස්ව වර්ධනයට යොමු කරන්න. ඒ සඳහා ආධාරක නූල් ගැටගසන්න.
- බිංදු ජල සම්පාදන පද්ධතියක් භාවිතා කිරීම යෝග්‍ය වන අතර ජල සම්පාදන පද්ධතිය හරහා පොහොර යෙදීම ද සිදු කළ හැකිය.

## පසු නඩත්තු කටයුතු

- මල් හට ගැනීමේදී, ප්‍රථමයෙන් හට ගන්නේ පිරිමි මල් වන අතර ඒවා ප්‍රධාන කදේ හට ගනී.
- ස්ත්‍රී මල් හට ගන්නේ පාර්ශ්වීය වැල් වල වේ. පෙ.ව. 10.30ට පෙර අතින් පරාගණය සිදු කරන්න.

- පරාගනයෙන් පසු ගෙඩියක් වැඩෙන බව නිරීක්ෂණය කළ පසු, කැන්ටලූප් වැල කප්පාදු කිරීම ආරම්භ කරන්න.
- එක ගෙඩියක් පමණක් වර්ධනය වීමට සලස්වන්න.
- ගෙඩියේ පිහිටීම පස මට්ටමේ සිට 4 සහ 7 වන අංකුර අතර තිබීම තිබීම වඩා සුදුසුය.
- ගෙඩිය සහිත ප්‍රධාන වැල අඩි 6 ක උසින් කප්පාදු කරන අතර එහි හට ගන්නා සියලුම පාර්ශ්වීය වැල් ද කප්පාදු කළ යුතුය.
- ගෙඩි විශාල වීමට හා පැණිරස (Brix) වැඩි වීමට වැල කප්පාදුව අතිශය වැදගත් වේ.
- එමෙන්ම ගෙඩියේ නියමිත බර පවත්වා ගැනීමට මෙම කප්පාදුව වැදගත් වේ.
- ගෙඩියක බර ග්‍රෑම් 1300 - 2000 ක් අතර තිබීමෙන්, වෙළඳපලේ ඉහල මිලක් ලබා ගත හැක.
- පැල සිටුවා දින 60 - 70 කදී (වර්ගය අනුව වෙනස් වේ) අස්වැන්න නෙලා ගත හැක.
- ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම අනුගමනය වඩා සුදුසු වේ.



## ඔබගේ වගාව සඳහා බීජ ලබා ගැනීමට

- ආනයනික බීජ වෙළඳපලෙන් මිලදී ගත හැක
- බීජ මිලදී ගැනීමේදී,
  - මිලදී ගන්නා වර්ගයේ වගා කාලය,
  - ඵලාවරණයේ වර්ණය,
  - ඵලාවරණයේ ස්වභාවය (**Shape of the netting**),
  - මදයේ වර්ණය,
  - මදයේ පැණිරස (Brix) අගය,
  - ගෙඩියේ සාමාන්‍යය බර
  - රෝග පළිබෝධ වලට දක්වන ප්‍රතිරොධීතාවය පිළිබඳව අවධානය යොමු කරන්න.





*තාක්ෂණික කරුණු හා උපදේශකත්වය - ආචාර්ය නිලූෂා අමරසිංහ - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ),*
*පළතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව.*

*දුරකථන අංකය - 0812 388387*

පරිගණක නිර්මාණය : අයි.සී.බී.හේරත්
සැකසුම : කේ.එම් සිරිවර්ධන (තාක්ෂණික සහකාර - කෘෂි ව්‍යාප්ති)
අධීක්ෂණය : ඩබ්.එල්.හිරාන් පීරිස් (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), ටී.එම්.පී.ජී.එස්.පී.තෙන්නකෝන් (අතිරේක අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම්. හලීම්ඩීන් (නියෝජ්‍ය අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන) එච්.ජේ.කේ. කීර්තිරත්න (නියෝජ්‍ය අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන)